තනතුර පුරප්පාඩු

කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ

01. පරිගණක තාක්ෂණ සහකාර - පුරප්පාඩු 01

අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :

අධ්‍යාපනික සුදුසුකම් :

(අ) i. සිංහල / දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii. ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පොස (සා.පෙ)විභාගයෙන් එක් වතාවකදි විෂයන් හයකින් සමත් වී තිබීම.

(ආ) අ.පොස. (උ.පෙ.) විභාගයේදී "සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අවශ්‍ය විෂයයන් සංඛ්‍යාවෙන් සාමාර්ථය ලැබ තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය කාර්ය සාධන මට්ටම අත කං ගෙන තිබීම.

වෘත්තීය සුදුසුකම් :

පිළිගත් ආයතනකින් ලබා ගත් පරිගණක මෘදුකාංග / දෘඪාංග පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමාවක් හෝ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඊට සමාන සුදුසුකම් ලබා තිබීම. (N.V.Q. 05 ට නො අඩු)

සහ

අදාල ක්ෂේත්‍ර යේ වසරක (01) පලපුරුද්දක් ලබා තිබීම.

වයස : අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් සංකේතය හා වැටුප් පරිමාණය

MA 2-2:- රු. [50,540 – 10x540 – 7x630 – 4x1,080 – 20x1,280 –90,270]

<u>වෙනත් ප්‍රතිලාභ :</u>

අයදුම්කරුවන් තම වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායකත්වය දැරිය යුතු අතර, ආයතනය විසින් ඒ සඳහා වැටුපෙන් 15% ක් සේවක අර්ථසාධක අරමුදලට(EPF) සහ 3% ක් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට (ETF) දායකත්වයක් දරනු ඇත.

ඉහත සඳහන් වැටුප් වලට අමතරව රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව සහ අදාල අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.

ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය ප්‍රතිලාභ හිමිකම් යෝජනා ක්‍රමයක්ද ක්‍රියාත්මක කෙරේ.

අධ්‍යාපන සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කරන සහතික වල පිටපත් ද ඥාති සම්බන්ධයක් නැති විස්තර සැපයිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද සහිත සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **අධ්‍යක්ෂ, හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 114, විජේරාම මාවත,කොළඹ 07** යන ලිපිනයට **2026.11.18** වන දින හෝ ඊට පෙර **ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.** අයදුම් කරන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍ර කාර්යාල වේලාවන් තුළදී ආයතනයේ ලේඛකාධිකාරී කාර්යාලයෙන් ලබා ගත හැකිය. එසේ නැතහොත් ආයතනයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. සියලු විස්තර **www.harti.gov.lk** වෙබ් අඩවියෙහි අන්තර්ගතය.

රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා හෝ දෙපාර්තමේන්තුවල ඉල්ලුම්කරුවන් සිය ඉල්ලුම් පත්‍ර ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.

අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි
හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.
011 - 2696981